

ආචාර්ය
පාලිත ගනේවත්ත

# සාහිත්‍ය සම්භාෂණ 8

# උමංදාවේ උපහාස කථා

සිංහල ජාතක පොතේ විශාලතම ජාතක කතාව ලෙස සැළකිය හැකි උමංදාව ගැන පසුගිය සටහනෙන් හැඳින්වීමක් කළ අවස්ථාවේදී, උමංදාවෙන් මහ බෝසතුන්ගේ ප්‍රඥා මහිමය ගැන මෙන්ම බමුණු පණ්ඩිතය හා රජුන් කර්කශ උපහාසයට ලක් කරන අවස්ථා ඇති බවද සඳහන් කළෙමු. උමංදාවේ (උම්මග්ග ජාතකය) උපහාසාත්මක ස්වරූපය ගැන මේ සටහනෙන් මදක් අවධානය යොමු කරමු.

මහ බෝසතුන් මහෞෂධ පණ්ඩිතයාව ඉපදී ඔහුගේ නැණ ගුණ දඹදිව පුරා පැතිර යද්දී වේදේහ රජතුමා ළදරු වියේ සිටි මහෞෂධ කුමරා රාජ සේවයට බඳවා ගැනීමට තැත් කරයි. ඒ සියළුම ප්‍රයත්නයන් අසාර්ථක වන්නේ වේදේහ රජුගේ මහ පුරෝහිත බමුණා ලෙස සිටි සේනකයාගේ විරුද්ධත්වය නිසාය. සේනකයාගේ බස් අසන වේදේහ රජු මහෞෂධ කුමරුන් විමසනු පිණිස විවිධ ප්‍රශ්ණ ඉදිරිපත් කරයි. උසස් කෙටි කතාවක ස්වරූපය දරන කාලගෝල ප්‍රශ්නයද විසඳීම නිසා මහෞෂධ කුමාරයන් ගේ කීර්තිය රජු වෙත ළඟා වූ මොහොතේදී පවා ඔවුන් රජ වාසලට ගෙන්වා ගැනීම වළකන්නේ සේනකයා විසිණි. අවසානයේදී මහෞෂධ පණ්ඩිතයන් වේදේහ රජු මාලිගයට පැමිණීමෙන් පසුව උදුම්බරා දේවියගේ ජීවිතය බේරා ගන්නේද මහෞෂධයන්ගේ ප්‍රඥා මහිමයෙනි. මේ සිදුවීමට පාදක වූ සිරි කාලකණ්ණි ප්‍රශ්ණය ද උපහාස රසයෙන් අනූනය.

මියුලු නුවර පිංගුත්තර නම් ළදරුවා තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් ළඟ ඉතාම හොඳින් ශිල්ප හදාරා එකල සිරිතට අනුව දිසාපාමොක් ඇදුරිඳු ගේ රූමත් තරුණ දියණිය ද සරණ පාවා ගෙන ආචාරීන්ගෙන් සිත් රිදවීමට බියෙන් අකමැත්තෙන් වුවද දෙවඟනක් බඳු කුමරිය සමඟ ගම රට බලා පිටත් විය. අනතුරුව උමදං කතුවරයා මෙසේ ලියයි.

'' ඒ තෙමේ රාත්‍රී භාගයෙහි, සකස් කොට හතුරන ලද ශ්‍රී යහනෙහි සැතැපිණ. කුමාරිකා අවුත් හැඳට නැගෙන්නා හාම, තතනමින් හැඳින් බැස බිමැ හෙව වැද හොත්තේය. ඒ කුමාරිකා ද හැඳින් බැස ඒ මානවකයා සමීපයට ගියාය. ඒ තෙමේ ඒ තැනින් නැඟී සිට නැවැත හැදට පැන නැංගේය. නැවැත ඒ කුමාරිකාද හැදට නැංගාය. ඒ තෙමේ නැවැත හැඳින් බටුයේය. කාළකණ්ණියා, නම් ශ්‍රී කාන්තාව හා සමඟ අහස පොළොව සේ ළඟා නොවන්නේය. එසේ හෙයින් කුමාරිකා යහනෙහිම සැතැපුණිය. ඒ කාලකණ්ණි බිමැ වැද හොත්තේය"

මෙම උද්රුතයෙන් ධ්වනිත වන උපමාව වටහා ගැනීම අපහසු නොවේ. -පිංගුත්තරයා තක්සලාවට ගොස් ශිල්ප උගත්තේ වහාම උගතයි උමංදාව කියයි. මෙයින් පෙනී යන්නේ පිංගුත්තරයා ඉතාම ශූර ලෙස ශිල්ප හැදෑරූ බවය. එවන් උගත්කමක් ලත් අයකු පවා විවාහ ජීවිතය යනු කුමක්දැයි නොදන්නා අඥාණයකු ලෙසය මේ විස්තරයෙන් පෙනෙන්නේ. තක්සලාවෙන් උගෙන ඉහලට ශාස්ත්‍රඥාණ ලැබුවද පිංගුත්තරයා ලෝක ව්‍යවහාරය පිළිබඳ ප්‍රායෝගික දැනුමෙන් තොර වූවකු බවයි මෙයින් හෙළිවන්නේ. මේ පුවත මෙකලටත් ඉතාම උචිතය.

වර්තමානයේ විශ්ව විද්‍යාලවලින් පරතෙරටම ඉගෙන ඉහලට ශාස්ත්‍ර සුදුසුකම් ලැබුවද ජීවිතය පිළිබඳ ප්‍රායෝගික දැනුමෙන් තොරව දිවි පෙවත අසාර්ථක කරගත් වත්මන් -පිංගුත්තරයන්" ගැන අප සියල්ලෝම පාහේ දනිමු. මේ අනුව උමංදාවෙහි -සිරි කාලකණ්ණි ප්‍රශ්ණය" ව්‍යවහාර දිවි පෙවෙත නොසලකා ශාස්ත්‍රය පමණක් උගන්වා, වර්තමාන උසස් අධ්‍යාපන ආයතන උපහාසයට ලක් කරන ප්‍රවෘත්තියක් ලෙස සැලකිය නොහැකිද?

උමංදාවෙහි එන 'සතර කන් මන්ත්‍රණය' ගැන අවධානය යොමු කරමු. උත්තර පංචාල නුවර චුලනී බ්‍රහ්මදත්ත රජු කේවට්ටයාගේ උපදෙස් මත මුළු දඹදිවම අත්පත් කරගෙන රජවීමට ඉතා දුෂ්ට කුමන්ත්‍රණයක යෙදෙයි. බ්‍රහ්මදත්ත රජ කේවට්ටයා සමඟ මඟුල් උයනට ගොස් කරන රහස් මන්ත්‍රණයට මහෞෂධ පණ්ඩිතයාන්ගේ ගිරා පෝතකයා සවන් දෙන්නේ මඟුල් උයනේ මඟුල් සල් ගස් කොල අතර සැඟවී ගෙනය. කේවට්ටයා බ්‍රහ්මදත්ත රජුට රහස් කියා නිමවූ විගසම ඔහුගේ හිසට වර්චස් පිඬක් හෙළන ගිරා පෝතකයා 'කිමෙක්දෑ' යි කට දල්වා ගෙන උඩ බැලූ කේවට්ටයාගේ කටටද නැවත වර්චස් පිඬක් හෙළා -ක්‍රීන්' යන අනුකරණයෙන් පියඹා ගොස් මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රසාදයට යයි.

<u>බ්‍රහ්මදත්ත රජ කේවට්ටයා සමඟ මඟුල් උයනට ගොස් කරන රහස් මන්ත්‍රණයට මහෞෂධ පණ්ඩිතයාන්ගේ ගිරා පෝතකයා සවන් දෙන්නේ මඟුල් උයනේ මඟුල් සල් ගස් කොල අතර සැඟවී ගෙනය. කේවට්ටයා බ්‍රහ්මදත්ත රජුට රහස් කියා නිමවූ විගසම ඔහුගේ හිසට වර්චස් පිඬක් හෙළන ගිරා පෝතකයා 'කිමෙක්දෑ' යි කට දල්වා ගෙන උඩ බැලූ කේවට්ටයාගේ කටටද නැවත වර්චස් පිඬක් හෙළා -ක්‍රීන්' යන අනුකරණයෙන් පියඹා ගොස් මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රසාදයට යයි.</u>

මෙය ග්‍රාමව වර්ණයක් ලෙස සලකා බැහැර කළ නොහැකිය. මානයෙන් උදම් වූ චූලනි බ්‍රහ්මදත්ත රජුට උපදෙස් දෙන බමුණු අනුශාසකයන් කර්කශ උපහාසයට හසුකරන වර්ණනයක් ලෙසින් මෙය හැඳින්විය හැක්කේ.

මෙවන් සෝපාහාස පුවත් මෙන්ම වේදේහ රජුගේ මෝඩකමත් අමන කමත් මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා මහිමය නිසා වේදේහ රජු ඇතුළු මුළු රාජ්‍යයම සතුරු කුමන්ත්‍රණයකින් බේරා ගන්නා සැටිත් උමංදාවේ ප්‍රධාන පුවතින් වර්ණවත් වෙයි. උමංදාවේ පරිමණ්ඩ කතා නමින් හැඳින්වෙන පරිවාර කථාවලින් මහෞෂධ පණ්ඩිතයාන්ගේ ප්‍රඥා මහිමය මනාව පිළිබිඹු වෙයි. ඒ පිළිබඳව ඉදිරි සටහන මගින් අවධානය යොමු කරමු.





